www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉරාන සිසුන්ට එරෙහිව නඩු පැවරීමට විරෝධය දැක්වීමේ පිකට් උද්ඝෝෂනයක් හා රැස්වීමක් ශ්‍රී ලංකාවේ දී

**Demonstration and meeting in Sri Lanka to protest prosecution of Iranian students**

**2008 මාර්තු 7**

ඉරාන ආන්ඩුව එරට වාමාංශික සිසුන් 40කට වැඩි පිරිසක් අත් අඩංගුවේ රඳවා ගෙන ඔවුන්ට එරෙහිව නඩු පැවරීමට ගැනීමට විරෝධය දක්වනු වස් සමාජවාදී සමානතා පක්ෂය (සසප) සහ එහි ශිෂ්‍ය සංවිධානය වන සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) කොලඹ දී පිකට් උද්ඝෝෂනයක් හා ප්‍රසිද්ධ රැස්වීමක් පවත්වනු ඇත. මෙම උද්ඝෝෂනය සසජාශි අරඹා ඇති ජාත්‍යන්තර උද්ඝෝෂනයක කොටසකි.

අත් අඩංගුවට ගෙන ඇත්තේ "නිදහස හා සමානතාව උදෙසා ශිෂ්‍යයෝ" කන්ඩායමේ කොටසකි. දෙසැම්බරයේ දී, මෙම කන්ඩායම ඉරාන දේශපාලන සංස්ථාපිතයේ සියලු කන්ඩායම්වලට විරුද්ධත්වය පල කරන අතර ම, ඉරානයට එරෙහි එක්සත් ජනපද යුද සැලසුම් හෙලා දකිනු පිනිස ස්වාධීන විරෝධතා දැක්මක් සංවිධානය කලේ ය. එම උද්ඝෝෂනයෙන් පසුව සිසුන් 30කට වැඩි පිරිසක් අත් අඩංගුවට ගැනුනු අතර ජනවාරි 15 දා තවත් 10ක් අත් අඩංගුවට ගන්නා ලදි.

සිසුන් සමහරෙක් ඇප පිට නිදහස් කොට ඇතත්, ඩොලර් 80,000 සිට ඩොලර් 300,000 දක්වා වූ ඉතා ඉහල ඇප මුදල් ගෙවීමට අනෙක් සිසුහු අසමත්ව ඇත. සමහර සිසුන්ට, විශේෂයෙන් ම කන්ඩායමේ නායකයන් බව කියනු ලබන අයට, ඇප ලබා ගැනීමේ විකල්පය අහිමි කරනු ලැබ ඇත. බන්ධනාගාරයෙන් පිටත මිතුරන් හෝ පවුලේ සාමාජිකයන් සමග මොන යම් හෝ සබඳතාවක් ඇති කර ගැනීමෙන් ඔවුන්ව වලකනු ලැබ ඇත. නිදහස් වූ අයට අනුව, විදුලි කම්පන, පහරදීම් හා ලිංගික අපචාර ඇතුලු වධ බන්ධනවලට සිසුන් ලක් කෙරී ඇත. සියලු ම සිසුන්ට එරෙහිව නඩු පවරනු ලැබෙන අතර ඒවායේ ප්‍රතිඵල ලෙස දීර්ඝ කාලීන සිර දඬුවම්වලට, විද්‍යාලවලින් නෙරපීමට හෝ වෙනත් ආකාර දඬුවම්වලට මුහුන දීමට ඔවුන්ට සිදු වනු ඇත.

අඩු ගනනේ සිසුන් හත් දෙනෙක් වත් තවමත් බන්ධනාගාරයේ දුක් විඳිමින් සිටි, ඔවුන් නම්: බෙරූස් කරිමිෂාද්, අලි කන්තූරි, අමින් කොෂායි, බෙෂාඩ් බගිරි, පේමන් පිරාන්, ෆහාඩ් හජි මිර්ෂාලේ සහ මොර්ටෙෂා බෙඩ්මචිලූ. ඉරාන කුර්දිස්තානයේ අගනුවර වන සනන්ඩාජ්හි ක්‍රියාකාරිකයකු වන මිර්ෂාලේ කුප්‍රකට එවින් දඟ ගෙයෙහි දරුනු වධ බන්ධනවලට යටත් කරනු ලැබ තිබීමට ඉඩ ඇත. එහි තත්වය පිලිබඳව සමීප දැනුමක් ඇති අයෙක් පැවසුවේ මිර්ෂාලේ දඟ ගෙය තුල දී මරා දැමීමේ ඉඩකඩ සම්බන්ධව සිසුන් අතර උත්සුකතා පවතින බව යි. අත් අඩංගුවට ගත් සියලු සිසුන් වහාම හා කොන්දේසි විරහිතව නිදහස් කරන ලෙස සසප හා සසජාශි ඉල්ලා සිටී. ඔවුන්ට එරෙහි සියලු චෝදනා ඉවත් කර ගත යුතු ය.

සසප හා සසජාශි මෙම සිසුන් නිදහස් කරන ලෙස ඉල්ලමින් කොලඹ 7, නිදහස් මාවතේ අංක 5 දරන ස්ථානයේ පිහිටි ඉරාන ඉස්ලාමීය ජනරජයේ තානාපති කාර්යාලය වෙත මාර්තු 10 දා ලිපියක් බාර දෙනු ඇත.

© www.wsws.org